# මර්කන්ටයිල් ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් ෆයිනෑන්ස් පී.එල්.සී

Mercantile Investments and Finance PLC

236, ගාලු පාර, කොළඹ 03. දුරකථන: 011-2343720-7 www.mi.com.lk

- අර්නස්ට් ඇන්ඩ් යංග් විගණන ආයතනය විසින් 2023/2024 වර්ෂය සඳහා නිකුත් කරන ලද විගණන වාර්තාවේ සිංහල පරිවර්තනය පහත දැක්වේ.
- මෙහි භාෂා අතර යම් අනුකූලතාවයක් (වෙනසක්) ඇති වුවහොත් ඉංග්‍රීසි බසින් පලකල වර්තාව බල පැවැත්වේ.

EY
Building a better working world

Ernst & Young
Chartered Accountants
Rotunda Towers
No. 109, Galle Road
P.O. Box 101
Colombo 03, Sri Lanka

Tel : +94 11 246 3500
Fax : +94 11 768 7869
Email: eysl@lk.ey.com
ey.com

GSM/UM/RMD/DM

**මර්කන්ටයිල් ඉන්වෙස්ට්මන්ට් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී විසින් සිය කොටස්කරුවන් වෙනුවෙන් නිකුත් කරනු ලබන, ස්වාධීන විගණන නිළධාරියෙකු විසින් විගණනය කළ විගණන වාර්තාව**

**මතය**

මෙම වාර්තාවේ අඩංගු මර්කන්ටයිල් ඉන්වෙස්ට්මන්ට් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී හි 2024 වර්ෂයේ මාර්තු 31 වැනිදා දක්වා වූ මූල්‍ය වාර්තාව අප විසින් විගණනය කලෙමු. එහිදී ආයතනයේ 2024 මාර්තු 31 වන දිනට මූල්‍ය තත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ සහ අනෙකුත් විස්තීරණ ආදායම් ප්‍රකාශය, හිමිකම් වෙනස්වීම් ප්‍රකාශය, මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය හා මූල්‍ය ප්‍රකාශනයන් ට සම්බන්ධ සටහන් අනුකූලව දුව්‍යමය ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශයක් ඇතුළුව සටහන් කර ඇත.

අපගේ මතය අනුව මේ සමගින් ඇති මූල්‍ය ප්‍රකාශන, මේ වසරේ 2024 මාර්තු 31 වැනි දිනට සමාගමේ මූල්‍ය තත්වය හා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව අවසන් වූ වර්ෂය සඳහා එහි මූල්‍ය ප්‍රවාහයන් පිළිබඳ සත්‍ය හා සාධාරණ දැක්මක් ලබාදෙයි.

**අපගේ මතය සඳහා පදනම**

අප අපගේ විගණනයන් ශ්‍රී ලංකාවේ විගණන ප්‍රමිතීන්ට අනුකූලව සිදුකර ඇත. මෙම ප්‍රමිතීන්ට අනුකූලව අපගේ වගකීම්, අපගේ වාර්තාවේ මූල්‍ය වාර්තා විගණනයේදී විගණනකරුගේ වගකීම් යන කොටසේ දන්වා ඇත. අප ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකරුවන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද ආචාරධර්ම සංග්‍රහයට අනුකූල ස්වාධීන ආයතනයක් වන අතර අප අපගේ අනෙකුත් සදාචාරාත්මක වගකීම් මෙම ආචාර්ධර්ම වලට අනුකූලව සම්පූර්ණ කර ඇත. අප ලබාගෙන ඇති විගණන සාක්ෂි අපගේ මතය (විගණන) සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත බව අපි විශ්වාස කරමු.

**ප්‍රධාන විගණන කරුණු**

අපගේ වෘත්තීය විනිශ්චයන්ට අනුව මෙහි ප්‍රධාන විගණන කාරණා වනුයේ, වත්මන් කාලපරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීමේදී වඩාත් වැදගත් වූ කරුණුය. සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීමේ සන්දර්භය (සිදුවීම) තුළ මෙම කරුණු විස්තර කරන ලදී. සහ ඒ පිළිබඳව අපගේ මතය සකස් කිරීමේදී අපි මෙම කරුණු පිළිබඳව වෙනම මතයක් ඉදිරිපත් නොකරමු.

**ප්‍රධාන විගණන කාරණය**

**මූල්‍ය හානිකරණ සඳහා දීමනා**

මූල්‍ය වත්කම් හානිකරණ සඳහා දීමනා රුපියල් බිලියන 2.1 ක ණය සහ අත්තිකාරම් වලින් පසන නගින රුපියල් බිලියන 19.7 (සටහන 23) සහ මූල්‍ය බදු සහ කුලී සින්තක්කර රුපියල් බිලියන 28.2 ක කුලියට මිලදී ගැනීම් (සටහන 24 සහ 25) සහ අනෙකුත් මූල්‍ය වත්කම් රුපියල් බිලියන 0.6 (සටහන 26.1) ගිණුම්කරණ ප්‍රතිපත්ති සටහන් අංක 3.2 මත පදනම්ව කළමනාකරණය විසින් තීරණය කරනු ලැබේ.

**මෙය ප්‍රධාන විගණන කාරණාවක් විය**

මූල්‍ය වත්කම් සඳහා අනාගත මුදල් ප්‍රවාහයන් පිළිබඳ කළමනාකාරිත්වයේ අපේක්ෂාව හා සම්බන්ධ සැලකිය යුතු කළමනාකරණ විනිශ්චයන්, උපකල්පන සහ ඇස්තමේන්තු අවිනිශ්චිතතාවයේ මට්ටමට සම්බන්ධ වීම.

හානිකරණ දීමනා අගයන් හි ප්‍රමාණාත්මකභාවය සහ එහි සංකීර්ණ ගණනය කිරීම් පිළිබඳව තීරණ ගැනීම.

කළමනාකරණය විසින් භාවිතා කරන ලද සැලකිය යුතු විනිශ්චයන්, උපකල්පන සහ ඇස්තමේන්තු වල ප්‍රධාන ක්ෂේත්‍ර ඇතුළත් වේ. උපකල්පනය සඳහා කරන ලද අනාගත සිදුවීම් සහ/හෝ ගනුදෙනු සහ ඉදිරි දැක්ම සාර්ව ආර්ථික අවස්ථා සහ ඒවාට අනුබද්ධ බර තබන ලද අගයන්, සහපයෙන් ඉහළ යන ඇස්තමේන්තු අවිනිශ්චිතතාවයන්ට යටත් වේ.

**මූල්‍ය වාර්තාකරණය සඳහා වූ අභ්‍යන්තර පාලනය සම්බන්ධ තොරතුරු තාක්ෂණ පද්ධතියන්.**

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය බහුවිධ තොරතුරු තාක්ෂණ පද්ධති සහ අදාළ අභ්‍යන්තර පාලනයන් මත සැලකිය යුතු ලෙස රඳා පවතී. තවද, පැතුරුම්පත් භාවිතයෙන් සම්පාදනය කර සකස් කරන ලද තොරතුරු තාක්ෂණ පද්ධති මගින් ජනනය කරන ලද දත්ත සහ වාර්තා භාවිතා කරමින් ප්‍රධාන මූල්‍ය ප්‍රකාශන හෙළිදරව් කිරීම් සකස් කරනු ලැබේ.

ඒ අනුව, මූල්‍ය වාර්තාකරණය පිළිබඳ තොරතුරු තාක්ෂණ පද්ධති සම්බන්ධ අභ්‍යන්තර පාලනයන් ප්‍රධාන විගණන කරුණක් ලෙස සැලකේ.
සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය බහුවිධ තොරතුරු තාක්ෂණ පද්ධති සහ අදාළ අභ්‍යන්තර පාලනයන් මත සැලකිය යුතු ලෙස රඳා පවතී. තවද, පැතුරුම්පත් භාවිතයෙන් සම්පාදනය කර සකස් කරන ලද තොරතුරු තාක්ෂණ පද්ධති මගින් ජනනය කරන ලද දත්ත සහ වාර්තා භාවිතා කරමින් ප්‍රධාන මූල්‍ය ප්‍රකාශන හෙළිදරව් කිරීම් සකස් කරනු ලැබේ.

ඒ අනුව, මූල්‍ය වාර්තාකරණය පිළිබඳ තොරතුරු තාක්ෂණ පද්ධති සම්බන්ධ අභ්‍යන්තර පාලනයන් ප්‍රධාන විගණන කරුණක් ලෙස සැලකේ.

**අපගේ විගණනය ප්‍රධාන විගණන කාරණා ආමන්ත්‍රණය කළ ආකාරය**

අපගේ විගණන ක්‍රියා පටිපාටිය තුළදී මූල්‍ය වත්කම්වල හානිය සඳහා වන දීමනාවල ප්‍රමාණාත්මක බව ගණනය කිරීමේදී පහත ප්‍රධාන ක්‍රියා පටිපාටිය ඇතුළත් වේ.

- අප වාර්තා කරන දිනය දක්වා පවතින හොඳම තොරතුරු මත පදනම්ව, එහි ගිණුම්කරණ ප්‍රතිපත්ති සමග ආර්ථික තත්වයන්ට ප්‍රතිචාර දැක්වීම ඇතුළුව දුර්වලතා ගණනය කිරීම් සහ බල පවත්වන ක්‍රමවේදයන් සඳහා සමාගමේ දීමනා පෙළ ගැස්වීම තක්සේරු කරන ලදී.
- මණ්ඩලය සහ කළමණාකාරිත්වය විසින් හානිකරණ සඳහා දීමනා, ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටිවල අධීක්ෂණ මට්ටම, සමාලෝචනය සහ අනුමත කිරීමේ මට්ටම තක්සේරු කිරීම ඇතුළත් වන අතර, හානිකරණ අධිතක්සේරු කිරීම පාලනය, ක්‍රියාත්මක කිරීම සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව ඇගයීමට ලක් කරන ලදී.
- සමාගමෙහි අදාළ මූලාශ්‍ර ලේඛණ සහ ගිණුම් වාර්තා හරස් පරීක්ෂා කිරීම මගින් හානිකරණ ගණනය කිරීම් සඳහා භාවිතා කරන ලද පාදක දත්තවල සම්පූර්ණත්වය, නිරවද්‍යතාව සහ සාධාරණ බව පරීක්ෂා කරන ලදී.
- ණය වල ගුණාත්මකභාවය අදාල වර්ගීකරණය අනුව සාධාරණව ඇගයීමට ලක් කරන ලදී.
- විනිශ්චයන්හි සාධාරණ බව තක්සේරු කර, භාවිතා කරන ලද උපකල්පන සහ ඇස්තමේන්තු හා උපකල්පනය කරන ලද අනාගත සිදුවීම් මුදල් ප්‍රවාහ පුරෝකථනය කළ කාලය සහ ගනුදෙනුවල ඇතුළත් වටිනාකම, අපකර අයකිරීම් සහ එහි තත්වයන්, සාර්ව ආර්ථික අවස්ථාවල ඉදිරිදැක්ම සහ එහි අනුබද්ධිත බර තැබීම.
- 23, 24, 25 සහ 26.1 සටහන්වල දක්වා ඇති අදාළ මූල්‍ය ප්‍රකාශන හෙළිදරව් කිරීම් සහ 3.2 සටහන් විස්තර කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති ප්‍රමාණවත් බව තක්සේරු කරන ලදී.

අපගේ විගණන ක්‍රියා පටිපාටි වලට පහත ප්‍රධාන පටිපාටි ඇතුළත් වේ.

- අදාල සැලකිය යුතු ක්‍රියාවලින්ගේ අභ්‍යන්තර පාලන පරිසරය පිළිබඳ අවබෝධයක් ලබාගෙන මූල්‍ය වාර්තාකරණය සහ අදාළ හෙළිදරව් කිරීම් සම්බන්ධ ප්‍රධාන පාලනයන් පරීක්ෂා කර ඇත.

**අපගේ අභ්‍යන්තර විශේෂිත සම්පත් සම්බන්ධ සහ;**

- සමාගමේ තොරතුරු තාක්ෂණ පාලන ව්‍යුහය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම.
- පරිශීලක ප්‍රවේශය සහ කළමනාකරණ වෙනස්වීම් සම්බන්ධයෙන් මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලනයන් සම්බන්ධ තොරතුරු තාක්ෂණ පද්ධතිවල සැලසුම් සහ මෙහෙයුම් ඵලදායිතාව හඳුනාගෙන ඇගයීමට ලක් කර පරීක්ෂා කර ඇත.
- සමාගමට අදාළ සයිබර් ආරක්ෂණ අවදානම සහ මෙම අවදානම් විසඳීමට ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව මූලික වශයෙන් විමසීම් හා ඒ පිළිබඳව ඉහල මට්ටමේ අවබෝධයක් ලබා ගැනීමට අවශ්‍ය ක්‍රියාවලි සහ පාලනයන් ක්‍රියාත්මක කිරීම.
- හෙළිදරව් කිරීම සඳහා භාවිතා කරන ලද මූලාශ්‍ර දත්ත සහ වාර්තා නිරවද්‍යතාවයෙන් සහ සම්පූර්ණත්වයෙන් පරීක්ෂා කරන ලදී.

**2024 වාර්ෂික මූල්‍ය වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු**

අනෙකුත් තොරතුරු සමාගමේ 2024 වාර්ෂික වාර්තාවෙහි ඇතුළත් තොරතුරු වලින් සමන්විත වේ. වාර්ෂික වාර්තාව සහ විගණන වාර්තාව හැර අනෙකුත් මූල්‍ය ප්‍රකාශවල තොරතුරු සඳහා කළමනාකාරිත්වය වගකිව යුතුයි. සමාගමේ 2024 වාර්ෂික වාර්තාව මෙම විගණන වාර්තා දිනයෙන් පසුව අප වෙත ලබා දීමට අපේක්ෂා කෙරේ.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අපගේ මතය අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර අපි ඒ පිළිබඳව කිසිදු ආකාරයක සහතික නිගමනයක් ප්‍රකාශ නොකරමු

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අපගේ විගණනය සම්බන්ධයෙන්, අපගේ වගකීම වන්නේ අනෙක් තොරතුරු කියවා, එසේ කිරීමේදී, ඒවා තොරතුරු මූල්‍ය ප්‍රකාශන වල ඇති තොරතුරු හා නොගැලපේ ද නැතහොත් අපගේ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් තොරතුරු වැරදි ලෙස පෙනේ නම් ඒවා ප්‍රකාශ අප විසින් සිදු කරන ලද කාර්යය මත පදනම්ව, ඒ තොරතුරුවල ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශ පවතී නම් ඒවා වාර්තා කිරීමය. මේ සම්බන්ධව කිසිවක් වාර්තා කිරීමට නැත.

**මූල්‍ය ප්‍රකාශනයන් සඳහා කළමණාකාරිත්වයේ හා පාලනය භාරව සිටින අයගේ වගකීම්**

ශ්‍රී ලංකාවේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය වාර්තාවන් මගින් සත්‍ය හා නිවැරදි දැක්මක් ලැබෙන පරිදි සකස් කිරීම කළමණාකාරිත්වයේ වගකීම වන්නාක් මෙන්ම එවැනි අභ්‍යන්තර පාලනයක් සිදුකරන කළමණාකාරිත්වයක් මගින්, වංචාවක් හෝ දෝෂයක් හේතුවෙන් නිවැරදි කරුණු අඩංගු නොවන මූල්‍ය ප්‍රකාශන සකස් නොකිරීම පිළිබඳ නිශ්චය කිරීමඳ අවශ්‍ය වේ.

මූල්‍ය වාර්තා සකස් කිරීමේදී අදාළ ආයතනයේ කළමණාකාරිත්වය විසින්, එම ආයතනය අවසන් කිරීමට හෝ නැවැත්වීමට අදහස් කරන්නේ නම් හා එසේ කිරීම හැර වෙනත් යථාර්ථවාදී විකල්පයක් නොමැති විටදී මිස අඛණ්ඩව ඉදිරියට යාමට ආයතනයට ඇති හැකියාව තක්සේරු කිරීම, ආයතනය තවදුරටත් ඉදිරියට යාමට ඇති හැකියාව හා එලෙස ඉදිරියට යාමට යෝග්‍ය හා තුඩුදෙන කරුණු එළි දැක්වීම මෙන්ම ගිණුම්කරණයේ අඛණ්ඩ සැලකිල්ල භාවිතා කිරීම වගකීම වේ.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සඳහා පාලනය සම්බන්ධයෙන් පත්කර සිටින පිරිස (කළමණාකාරිත්වය) වගකිව යුතුය.

**මූල්‍ය ප්‍රකාශන විගණනයේදී විගණනකරුවන්ගේ වගකීම්**

මූල්‍ය ප්‍රකාශන සම්පූර්ණයෙන්ම සාවද්‍ය ප්‍රකාශනයෙන් තොරද, වංචාවක් හෝ දෝෂයක් සහිතද යන්න පිළිබඳව සාධාරණ සහතිකයක් ලබාගැනීම අපගේ අරමුණු වේ. සාධාරණ සහතිකයක් යනු උසස් මට්ටමේ සහතිකයක් වන නමුත් එය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සිදුකරනු ලබන විගණනයකදී ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් (මූල්‍ය) සෑම්විටම අණාවරණය වන බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචාවකින් හෝ දෝෂයකින් සාවද්‍ය මූල්‍ය ප්‍රකාශයන් මතුවිය හැකි අතර, එමගින් තනි තනිව හෝ සමස්තයක් වශයෙන් මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගෙන ගනු ලබන පරිශීලකයන්ගේ ආර්ථික තීරණ කෙරෙහි සාධාරණ ලෙස බලපෑම් කරනු ඇතැයි අපේක්ෂා කළ හැක.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව අපගේ විගණනය පුරාවටම වෘත්තීය විනිශ්චය හා වෘත්තීය සංශයවාදය (සැකය) පවත්වා ගත්තෙමු, එසේම අප,

- වංචාවක් හෝ දෝෂයක් හේතුවෙන් සකස්වීය හැකි සාවද්‍ය කරුණු සහිත මූල්‍ය ප්‍රකාශනයන්හි අවධානම හඳුනාගැනීම හා තක්සේරු කිරීම, එම අවධානම් වලට ප්‍රතිචාර දක්වන ක්‍රියා පටිපාටි සැකසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම සහ අපගේ මතයට පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම. වංචා සහගත සාවද්‍ය ගිණුම් ප්‍රකාශයක් අණාවරණය කර නොගැනීමේ අවධානම දෝෂයක් හේතුවෙන් ඇතිවන ප්‍රතිඵලයකට වඩා වැඩිය. මන්ද වංචාවට, පැහැර හැරීම්, කුමන්ත්‍රණ, වේතනාන්විත අඩුපාඩු, වැරදි නිරූපණයන් හෝ අභ්‍යන්තර පාලනය ප්‍රතික්ෂේප කිරීම ඇතුළත්විය හැකිය. විගණන වාර්තාවක කරුණුමය සොයාගැනීම් සමාගමේ මූල්‍ය තොරතුරුවල සැලකිය යුතු දෝෂ හෝ අවධානම් පෙන්නුම් කරයි. තොරතුරු විගණන සොයාගැනීම් ප්‍රකාශයට පත් කරමින් විගණකවරුන් සිය සුදුසුකම් ලත් මතයක් නිකුත් කරයි.
- සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලතාවය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අරමුණින් නොව, පවතින තත්ත්වයන් යටතේ සුදුසු විගණන ක්‍රියා පටිපාටි සැලසුම් කිරීම සඳහා විගණනයට අදාළ අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම.
- භාවිතා කළ ගිණුම්කරණ ප්‍රතිපත්තිවල යෝග්‍යතාවය සහ කළමනාකරණය විසින් කරන ලද ගිණුම් ඇස්තමේන්තු සහ අදාළ හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය අගය කිරීම.
- ගිණුම්කරණයේ පවතින සැලකිල්ල (ක්‍රියාත්මක වෙමින් ලාභ ලබන ව්‍යාපාරයක්/ ඉදිරියට යන ව්‍යාපාරයක්) පදනම කළමණාකාරිත්වය විසින් භාවිතා කිරීමේ යෝග්‍යතාව සහ ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව, ඉදිරියට යාමට සමාගමට ඇති හැකියාව පිළිබඳ සැලකිය යුතු සැකයක් ඇති කළ හැකි සිදුවීම් හෝ කොන්දේසි සම්බන්ධයෙන් කරුණුවල අවිනිශ්චිතතාවක් පවතින්නේද යන්න නිගමනය කිරීම. කරුණුවල අවිනිශ්චිතතාවක් පවතින බව අප නිගමනය කරන්නේ නම්, මූල්‍ය ප්‍රකාශනවල අදාල හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවේ නම් අපගේ මතය වෙනස් කිරීම සඳහා අපගේ විගණක වාර්තාවේ අවධානය යොමුකිරීම අවශ්‍ය වේ. අපගේ නිගමනයන් පදනම් වන්නේ අදාළ දිනය දක්වා ලබාගත් විගණන වාර්තා මතයි. කෙසේ වෙතත් අනාගත සිදුවීම් හෝ කොන්දේසි, සමාගම තවදුරටත් ඉදිරියට යන ව්‍යාපාරයක් හෝ එහි නැවැත්වීමට හේතුවිය හැක.
- සමස්ථ ඉදිරිපත් කිරීම ගෙන බැලූ විට මූල්‍ය වාර්තාවන්හි අන්තර්ගතය හා ව්‍යුහය, හෙළිදරව් කිරීම්ද ඇතුළුව සහ සාධාරණ ඉදිරිපත් කිරීමක් සිදුවන ආකාරයට යටින් පවතින ගනුදෙනු හා සිදුවීම්ද නියෝජනය කරන්නේ ද යන්න නිශ්චය කිරීම.

විගණනයේ සැලසුම්ගත විෂය පථය හා කාලසීමාව සහ සැලකිය යුතු විගණන සොයාගැනීම් මෙන්ම අභ්‍යන්තර පාලනයේ කිසියම් සැලකිය යුතු දුර්වලතා වැනි අනෙකුත් ගැටළු සම්බන්ධයෙන් අප මෙහි (ආයතනයේ) පාලනාධිකාරීන් සමගින් සන්නිවේදනය කරමු.

අපි ස්වාධීනත්වය සම්බන්ධයෙන් අදාළ සදාචාරාත්මක අවශ්‍යතාවලට අනුකූලව කටයුතු කර ඇති බවට ප්‍රකාශයක් ද අපි පාලනයට සම්බන්ධ අයට ලබා දෙන අතර, අපගේ ස්වාධීනත්වයට සාධාරණ ලෙස බලපානු ඇතැයි සිතිය හැකි සියලු සබඳතා සහ අනෙකුත් කාරණා සහ අදාළ වන ඉවත් කිරීමට ගන්නා ක්‍රියාමාර්ග ඔවුන් සමඟ සන්නිවේදනය කිරීමට ද අපි කටයුතු කරමු

පරිපාලනය සම්බන්ධයෙන් වගකීම් දරන අය සමඟ සාකච්ඡා කරන ලද කරුණු අනුව, වත්මන් කාලපරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීමේදී වඩාත් වැදගත් වූ ප්‍රධාන විගණන කරුණු මොනවාදැයි අපි තීරණය කරමු. අපි අපගේ විගණක වාර්තාවේ මෙම කරුණු විස්තර කරන්නේ නීතිය හෝ රෙගුලාසි මගින් එම කාරණය පිළිබඳ මහජන හෙළිදරව් කිරීම වළක්වන්නේ නම් හෝ අතිශය දුර්ලභ අවස්ථාවන්හිදී, අපගේ වාර්තාවේ යම් කරුණක් සන්නිවේදනය නොකළ යුතු බව අපි තීරණය කරන්නේ එසේ කිරීමෙන් අහිතකර ප්‍රතිවිපාක සාධාරණ ලෙස අපේක්ෂා කළ හැකි බැවිනි. එවැනි සන්නිවේදනයකින් ලැබෙන අහිතකර ප්‍රතිවිපාක මහජනයාට ලැබෙන යහපතට වඩා වැඩිය.

**වෙනත් නීතිමය සහ නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2007 අංක 07 දරන සමාගම් පනතේ 163 (2) වගන්තියට අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලුම තොරතුරු සහ පැහැදිලි කිරීම් අප විසින් ලබාගෙන ඇති අතර, අපගේ පරීක්ෂණයෙන් පෙනෙන පරිදි, මෙම සමාගම නිසි ගිණුම් වාර්තා තබා ඇත.

මෙම ස්වාධීන විගණක වාර්තාවට අත්සන් කිරීම සඳහා වගකිව යුතු හවුල්කරුගේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සාමාජික අංකය 2471 වේ.

29 මැයි 2024
කොළඹ

Partners: D K Hulangamuwa FCA FCMA LLB (London), A P A Gunasekera FCA FCMA, Ms. Y A De Silva FCA, Ms. G G S Manatunga FCA, W K B S P Fernando FCA FCMA, B E Wijesuriya FCA FCMA, R N de Saram ACA FCMA, Ms. N A De Silva FCA, N M Sulaiman ACA ACMA, Ms. L K H L Fonseka FCA, Ms. P V K N Sajeewani FCA, A A J R Perera FCA ACMA, N Y R L Fernando ACA, D N Gamage ACA ACMA, C A Yalagala ACA ACMA

Principals: T P M Ruberu FCMA FCCA MBA (USJ-SL), G B Goudian ACMA, Ms. P S Paranavitane ACA ACMA LLB (Colombo), D L B Karunathilaka ACMA, W S J De Silva Bsc (Hons) - MIS Msc - IT, V Shakthivel B.Com (Sp)

A member firm of Ernst & Young Global Limited

## ලාභ හා අලාභ සහ වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශය

| මාර්තු 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා | 2024 (රු. '000) | 2023 (රු. '000) |
|---|---|---|
| **දළ ආදායම්** | 10,948,958 | 9,035,723 |
| පොලී ආදායම් | 10,628,251 | 8,749,868 |
| පොලී වියදම් | (6,441,603) | (6,134,824) |
| **ශුද්ධ පොලී ආදායම්** | 4,186,648 | 2,615,044 |
| ගාස්තු සහ කොමිස් ආදායම් | 75,732 | 75,568 |
| **ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම්** | 75,732 | 75,568 |
| වෙනත් මෙහෙයුම් ආදායම් | 244,975 | 210,288 |
| **මුළු මෙහෙයුම් ආදායම්** | 4,507,355 | 2,900,900 |
| ණය සහ වෙනත් හානිකරන (ගාස්තු) සඳහා නැවත හැරවීම | (7,911) | 276,201 |
| **ශුද්ධ මෙහෙයුම් ආදායම්** | 4,499,443 | 3,177,101 |
| **අඩු කළා: මෙහෙයුම් වියදම්** | | |
| පුද්ගල පිරිවැය | (1,592,749) | (1,302,861) |
| භාවිතයට ඇති අයිතිය ක්ෂය කිරීම සහ අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය කිරීම | (162,490) | (161,831) |
| වෙනත් මෙහෙයුම් වියදම් | (1,516,724) | (1,267,105) |
| **මුළු මෙහෙයුම් වියදම්** | (3,271,963) | (2,731,798) |
| **මූල්‍ය සේවා මත බදු වලට පෙර මෙහෙයුම් ලාභය** | 1,227,480 | 445,304 |
| මූල්‍ය සේවා මත බදු | (559,538) | (331,848) |
| **මූල්‍ය සේවා මත බදු වලට පසු මෙහෙයුම් ලාභය** | 667,943 | 113,456 |
| **එකතු කළා:** ආශ්‍රිත සමාගම්වල ලාභය/(අලාභය) | 151,837 | 19,365 |
| **බදු පැනවීමට පෙර මෙහෙයුම් වලින් ලාභය** | 819,780 | 132,820 |
| **අඩු කළා:** ආදායම් බදු වියදම් | (263,966) | (26,767) |
| **වසර සඳහා ලාභය** | 555,814 | 106,053 |
| **වෙනත් විස්තීරණ ආදායම්/(වියදම්)** | | |
| **අදාළ කාලයෙන් පසු ලාභයට සහ අලාභයට ප්‍රතිවර්ගීකරණය කළ යුතු අනෙකුත් විස්තීරණ ආදායම්/(වියදම්)** | | |
| විකුණුම් මූල්‍ය වත්කම් සඳහා පවතින වෙලඳපොල වටිනාකමේ වෙනස්වීම් | - | - |
| **අදාළ කාලයෙන් පසු ලාභයට සහ අලාභයට ප්‍රතිවර්ගීකරණය කළ යුතු අනෙකුත් විස්තීරණ ආදායම්/(වියදම්)** | - | - |
| **අදාළ කාලයෙන් පසු ලාභයට සහ අලාභයට ප්‍රතිවර්ගීකරණය නොකළ අනෙකුත් විස්තීරණ ආදායම්/(වියදම්)** | | |
| අනෙකුත් විස්තීරණ ආදායම හරහා මූල්‍ය ආයෝජනවල සාධාරණ වටිනාකමේ වෙනස්වීම් | 458,573 | 196,647 |
| ඉඩම් සහ ගොඩනැගිලිවල ප්‍රත්‍යාගණන අතිරික්තයේ ශුද්ධ වෙනස | 324,211 | - |
| ඉඩම් සහ ගොඩනැගිලිවල ප්‍රත්‍යාගණන අතිරික්තය සඳහා විලම්බිත බදු බලපෑම | (97,263) | (169,086) |
| ආශ්‍රිත සමාගම්වල වෙනත් විස්තීරණ ආදායමේ කොටස (ශුද්ධ බදු) | 13,897 | (98,662) |
| විශ්‍රාම පාරිතෝෂික වගකීම මත කාලගණන ලාභය/(අලාභය) | (60,120) | (13,210) |
| කාලගණන ලාභය මත විලම්බිත බදුවල බලපෑම | 14,073 | 19,927 |
| **අදාළ කාලයෙන් පසු ලාභයට සහ අලාභයට ප්‍රතිවර්ගීකරණය නොකළ ශුද්ධ අනෙකුත් විස්තීරණ ආදායම්/(වියදම්)** | 653,371 | (64,383) |
| **වර්ෂය සඳහා වෙනත් විස්තීරණ ආදායම්/(වියදම්) (ශුද්ධ බදු)** | 653,371 | (64,383) |
| **වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම්/(වියදම්) (ශුද්ධ බදු)** | 1,209,184 | 41,670 |
| **කොටසකට ඉපැයීම්** | | |
| සාමාන්‍ය කොටසකට මූලික ඉපැයීම් (රු.) | 184.90 | 35.28 |
| සාමාන්‍ය කොටසකට මිශ්‍ර ඉපැයීම් (රු.) | 184.90 | 35.28 |
| සාමාන්‍ය කොටසකට ලාභාංශ (රු.) | 20 | - |

## මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

| මාර්තු 31 දිනට | 2024 (රු. '000) | 2023 (රු. '000) |
|---|---|---|
| **වත්කම්** | | |
| මුදල් සහ මුදල් සමානතා | 2,492,057 | 1,791,064 |
| ක්‍රමක්ෂය පිරිවැයට බැංකු සමඟ කළ තැන්පතු | 3,460 | 1,422 |
| මූල්‍ය ආයෝජන - FVOCI (ප්‍රකාශිත) | 6,427,831 | 6,303,228 |
| මූල්‍ය ආයෝජන - FVPL | 329,519 | 3,250 |
| ක්‍රමක්ෂය පිරිවැය යටතේ ණය සහ ලැබිය යුතු දේ | 16,591,202 | 13,593,368 |
| ක්‍රමක්ෂය පිරිවැය යටතේ ලැබිය යුතු මූල්‍ය කල් බදු | 20,302,868 | 19,026,269 |
| ක්‍රමක්ෂය පිරිවැය යටතේ ලැබිය යුතු කුලී සින්තක්කර | 101,631 | 127,176 |
| මූල්‍ය ආයෝජන - FVOCI (අප්‍රකාශිත) | 70,427 | 70,427 |
| වෙනත් මූල්‍ය වත්කම් | 289,256 | 442,950 |
| තොගය | 101,181 | 314,853 |
| වෙනත් වත්කම් | 179,493 | 230,244 |
| ලැබිය යුතු බදු | - | 117,327 |
| ආශ්‍රිත සමාගම්වල ආයෝජනය | 1,404,225 | 1,255,524 |
| ආයෝජන වත්කම් | 260,055 | 227,219 |
| දේපල පිරියත සහ උපකරණ | 4,391,241 | 3,930,649 |
| පාවිච්චි කිරීමේ අයිතියට නතු වත්කම් | 215,306 | 139,667 |
| කල්බදු දේපල | 38,866 | 39,334 |
| අස්පෘශ්‍ය වත්කම් | 32,094 | 9,335 |
| **මුළු වත්කම්** | **53,230,713** | **47,623,304** |
| **වගකීම්** | | |
| බැංකු අයිරාව | 317,122 | 93,518 |
| ක්‍රමක්ෂය පිරිවැය යටතේ පාරිභෝගික තැන්පතු | 36,104,935 | 31,223,715 |
| ක්‍රමක්ෂය පිරිවැය යටතේ නිකුත් කළ ණය උපකරණ සහ වෙනත් ණය ගැනීම් | 2,441,542 | 3,487,442 |
| වෙනත් මූල්‍ය වගකීම් | 430,673 | 378,645 |
| වත්මන් බදු වගකීම් | 236,812 | - |
| විලම්බිත බදු වගකීම් | 750,164 | 795,864 |
| වෙනත් වගකීම් | 114,915 | 112,023 |
| විශ්‍රාම පාරිතෝෂික වගකීම් | 396,405 | 337,518 |
| කල් බදු වගකීම් | 273,077 | 178,573 |
| **මුළු වගකීම්** | **41,065,645** | **36,607,298** |
| **කොටස් හිමියන්ගේ අරමුදල** | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 36,000 | 36,000 |
| ප්‍රත්‍යාගණන සංචිතය | 2,884,448 | 2,643,604 |
| ව්‍යවස්ථාපිත සංචිත අරමුදල | 887,400 | 857,400 |
| පොදු සංචිත | 4,086,430 | 4,086,430 |
| රඳවා ගත් ඉපැයුම් | 3,122,457 | 2,721,856 |
| නියාමන පාඩු දීමනා සංචිතය | 1,067,522 | 1,043,234 |
| OCI සංචිතය තුලින් සාධාරණ වටිනාකම | 80,812 | (372,519) |
| **මුළු කොටස් හිමියන්ගේ අරමුදල්** | **12,165,069** | **11,016,006** |
| **මුළු වගකීම් සහ කොටස්කරුවන්ගේ අරමුදල්** | **53,230,713** | **47,623,304** |
| **කොටසකට ශුද්ධ වත්කම් (රු.)** | **4,047** | **3,665** |

**සහතික කිරීම**
2007 අංක 07 දරණ සමාගම් පනතේ අවශ්‍යතාවයන්ට අනුකූලව මෙම ම